# ශ්‍රී ලංකාවේ මහායාන බෝධිසත්ත්ව ප්‍රතිමා පිළිබඳ මූලික අධ්‍යයනයක්

කේ. එම්. එස්. ආර්. කුලතුංග[1]

ශ්‍රී ලංකාව ථේරවාදී බෞද්ධාගම පවතින රටක් වශයෙන් මුල් කාලීනව පැවැති අතර මහාවිහාරය ථේරවාදී බෞද්ධ මූලස්ථානයක් ලෙසින් මූලිකව ක්‍රියාත්මක වී ඇත. නමුත් මහායානවාදී අදහස් ශ්‍රී ලාංකේය බෞද්ධාගම තුළට ප්‍රවිශ්ට වීමත් සමගින් මෙතෙක් ථේරවාදී මූලස්ථානයක් ලෙසට ප්‍රබලව පැවති මහාවිහාරය යටපත් කරමින් රාජ්‍ය අනුග්‍රහය ද ලැබෙමින් අභයගිරිය නමින් නව මූලස්ථානයක් අනුරාධපුරයේ මහාවිහාරයට සමගාමීව ඉදිවන්නට වූ අතර එය මහායානවාදී අදහස් දැරූවන්ගේ මූලස්ථානය විය. ඉතා කෙටිකාලයක් තුළදී ජන විඥානය තුලට මහායාන වාදී අදහස් පහසුවෙන් යොමු වූ ආකාරයක් ඓතිහාසික මූලාශ්‍රය පරිශීලනය තුලින් මනාව වටහාගත හැකිය.

ශ්‍රී ලංකාවේ පූර්ණ මධ්‍යකාලීන අවධියේ ලක්දිව 8 සහ 9 වන සියවස් වල අභයගිරි වැසියන්ගේ ආගමික සංකල්ප වඩාත් සමාජය තුල ප්‍රකට වී යාමත් සමගින් මහාවිහාර වාසීන් වෙතින් රාජ්‍ය බලය සම්බන්ධව තිබූ බලපෑම් ක්‍රමයෙන් ලිහිල්ව යාමක් එක්වර සිදුවීම මත ප්‍රතිමා කලාව තුල බෝධිසත්ත්ව ප්‍රතිමා නිරමාණය වැදගත් සාධකයක් විය. ක්‍රි.ව 3 වන සියවසේ දී පමණ මහායානිකයන් විසින් බෝධිසත්ත්ව සංකල්පය මෙරටට හඳුන්වා දෙනු ලැබූ අතර ලංකාවේ පිළිගත් දහම ලෙසින් අනුරාධපුර යුගයේ සිට ථේරවාදී දහම පැවතිනි. නමුත් වරින්වර මහායාන බුදුසමය ලක්දිව නැගී ආ අතර ඊට කදිම නිදසුනක් ලෙසට ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශ වලින් මහායාන බුදුසමයේ ප්‍රධාන අංගයක් වන බෝධිසත්ත්ව වන්දනාව සිදුකළ බවට සාධක පැවතීම සඳහන් කළ හැකිය.

මා මෙම පර්යේෂණය තුළින් අපේක්ෂිත මූලික අරමුණු ලෙස, මහායානවාදයෙන් ශ්‍රී ලංකාවට ඇති වූ බලපෑම පුරා විද්‍යාත්මක වශයෙන් සොයා බැලීම, බෝධිසත්ත්ව සංකල්පයේ බලපෑම මත ලාංකේය ජන විඥාණය තුල ඇති වූ මහායානවාදී අදහස් වල පිළිබිඹු ඒරථකථනාත්මක විග්‍රහයක යෙදීම, ථේරවාදී බලපෑම් මත ඉදි වූ බුද්ධ ප්‍රතිමා හා මහායානවාදී බලපෑම් මත ඉදි වූ බුද්ධ ප්‍රතිමා පිළිබඳ පුරා විද්‍යාත්මක වශයෙන් ගවේෂණය, මහායානවාදය ව්‍යාප්ති ප්‍රදේශය පිළිබඳ පුරා විද්‍යාත්මකව වශයෙන් අධ්‍යයනය, මහායානවාදී අදහස් ථේරවාදය සමග සමගාමීව ව්රතමාන සහ අතීත මිනිසුන් තුළ ක්‍රියාත්මක වූ අයුරු පුරා විද්‍යාත්මකව වශයෙන් අධ්‍යයනය යනුවෙනි.

මෙහි මූලික අධ්‍යයන ක්‍රමවේදය තුළින් ශ්‍රී ලංකාවේ මහායාන බුදුදහම ජන විඥානගත වීම කෙතෙක් දැයි යන්න එම අවධිය තුළ නිර්මාණය කරන ලද බෝධිසත්ත්ව ප්‍රතිමා වලින් වටහා ගත හැකිය.එහිදී ශ්‍රී ලංකාව තුළ ස්ථාන කීපයක නිර්මිත බෝධිසත්ත්ව ප්‍රතිමා හඳුනාගත හැකිය.ඒ අනුව, ලංකාවේ දක්නට ලැබෙන බෝධිසත්ත්ව ප්‍රතිමා ලෙසට, ''දඹේගොඩ ප්‍රතිමාව'', මෙය දැනට සොයාගෙන

1 පුරාවිද්‍යා අධ්‍යයන අංශය, දෙවන වසර(විශේෂවේදී), පේරාදෙණිය විශ්වවිද්‍යාලය

ඇති ලෝකයේ විශාලතම බෝධිසත්ත්ව ප්‍රතිමාව ලෙසට හඳුනාගනු ලබන අතර මින් අවලෝකිතෙශ්වර බෝධිසත්ත්වවරයා නිරූපණය කරනු ලැබේ.''බුදුරුවගල'',ශ්‍රී ලංකාවේ බෝධිසත්ත්ව ප්‍රතිමා අතරින් ඉතා වැඩි වැදගත්කමක් හිමිවන මෙහි බෝධිසත්ත්ව ප්‍රතිමා 6ක් දක්නට ලැබෙන අතර ලංකාවේ දැනට එකම ස්ථානයකින් වැඩිම බෝධිසත්ත්වවරුන් නිරූපණය වන්නා වූ එකම ස්ථානය ලෙසට හඳුනාගෙන ඇත.''කුෂ්ටරාජගල'',ගාල්ල මාතර වැලිගම ප්‍රවතයක නිරූපිත මෙහි අවලෝකිතේශ්වර බෝධිසත්ත්වවරු නිරූපණය වේ. ''සිතුල්පව්ව ප්‍රතිමාව'', ක්‍රි.ව 3 වන සියවසේ පමණ අමරාවතී ප්‍රතිමා සම්ප්‍රධාය අනුව ඉදිකර ඇති මෙම ප්‍රතිමාව මහායාන බෝධිසත්ත්ව වන්දනාව ප්‍රකට කරන්නකි. ඊට අමතරව මැදිරිගිරිය, අනුරාධපුරය, පොළොන්නරුව, කුරුණෑගල වෙහෙරගල,අම්බලන්තොට ආදී ස්ථානයන්හි බෝධිසත්ත්ව වන්දනය ප්‍රකට කරන්නා වූ ප්‍රතිමා හඳුනාගත හැකිය. මෙම බෝධිසත්ත්ව ප්‍රතිමා අද වනවිට ද නිරුපද්‍රිතව ශ්‍රී ලංකාව තුල තිබීම තුලින් පැහැදිලි වන්නේ තවමත් මිනිසුන් තුල ප්‍රතිමා පිළිබඳ ගෞරවයක් පවතින බවකි. එබැවින් මහායානවාදය, බුද්ධ ප්‍රතිමා හා එහි බලපෑම් පිළිබඳ තවදුරටත් විමසුමට ලක්කල යුතුය.

**ප්‍රමුඛ පද:** මහායාන වාදය, බෝධිසත්ත්ව වන්දනය, ථේරවාදය